# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 11 දරන
# පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 පෙබරවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1981 මාර්තු මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 30 යි  තැපැල් ගාස්තුව : ශත 50 යි

## 1981 අංක 11 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 පෙබරවාරි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 61/80.

### 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 11 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1968 අංක 32 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) පහත දැක්වෙන තැනැත්තකු නොවන, නියමිත දිනයේ දී හෝ එදිනට පසුව, ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවට ඇතුලු වන සහ වයස අවුරුදු දහසය ලබා ඇති හෝ ලබන්නා වූ සෑම තැනැත්තකු ම ලියාපදිංචි වීමට යටත් විය යුතු ය :—

(අ) (2) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීමෙන් ලියාපදිංචි වීමට යටත් නොවන තැනැත්තකු ; හෝ

(ආ) එම දිනයට පෙර හෝ එම දිනයේ දී හෝ එම දිනයට පසුව ආගමන හා විගමන පනතේ 10 වන වගන්තියේ විධිවිධාන කඩකරමින් ශ්‍රී ලංකාවට ඇතුලු වී ඇති හෝ ඇතුලු වන තැනැත්තකු ; හෝ

(ඇ) එම පනතේ 15 වන වගන්තියේ විධිවිධාන කඩකරමින්, එම දිනයේ දී හෝ ඊට පසුව ශ්‍රී ලංකාවේ සිටින තැනැත්තකු ; හෝ

(ඈ) 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම් (ක්‍රියාත්මක කිරීමේ) පනතේ 15 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාවෙන් ඉන්දියාවට පිට වී යාමට යටත් වූ තැනැත්තකු.".

3. (1) මේ පනත ආරම්භ වීමේ දිනයට පෙර දිනයේ වයස අවුරුදු දහසය සම්පූර්ණ කළ එහෙත් අවුරුදු දහඅට සම්පූර්ණ නොකළ සහ එම නිසා ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි වීමට යටත් නොවූ ද මේ පනත මගින් සංශෝධනය කරන ලද එම වගන්තියේ විධිවිධාන ප්‍රකාර ඒ දිනයේ දී එසේ ලියාපදිංචි වීමට යටත් වන්නා වූ ද යම් තැනැත්තකු, එම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ සහ එම විධිවිධානවලට අනුකූලව, ඒ ලියාපදිංචිවීම සඳහා වූ නියමිත කාලසීමාව ඇතුළත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරයි නම්, ඒ තැනැත්තා ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය යටතේ වූ වරදකට වරදකරු නොවන ලෙස සැලකිය යුතු ය. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය යටතේ වූ වරදකට ඇතැම් තැනැත්තන් වරදකරුවන් නොවන ලෙස සැලකිය යුතු බව.

2—ඒ 52759—16,450 (80/12)

(2) මේ වගන්තියේ " නියමිත කාල සීමාව " යන්නෙන්, (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු, ප්‍රධාන ප්‍රඥප්තියෙහි 7 වන වගන්තියෙහි (4) වන උපවගන්තිය සමඟ කියවිය යුතු 52 වන වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් ප්‍රකාර එම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ සහ ඒවාට අනුකූලව ලියාපදිංචිවීම සඳහා ඉල්ලුම් කිරීමට නියමිත කාලසීමාව අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා නම ලියා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.